අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Minister of Education, Higher Education and Vocational Education
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர) உதவி மதிப்பீடு - 2026**
General Certificate of Education (Ordinary Level) Examination - 2026

උපකාරක තක්සේරුව
உதவி மதிப்பீடு
Supportive Assessment

සිංහල මාධ්‍යය
தமிழ் மொழி மூலம்
Sinhala Medium

# පුරවැසි අධ්‍යාපනය

# CIVIC EDUCATION - குடியியற் கல்வி









**ප්‍රශ්න පත්‍රය I/II - வினாப்பத்திரம் I/II - Question Paper I/II**

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
**கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**
தேசிய மொழிகள் மற்றும் சமூக விஞ்ஞான கிளை
**Ministry of Education, Higher Education and Vocational Education**
National Languages and Humanities Branch

Past Papers Wiki

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

| 62 | S | I |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව - 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர) உதவி மதிப்பீடு - 2026
General Certificate of Education (Ord. Level) Supportive Assessment - 2026

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත්, යොදා ගන්න.

## පුරවැසි අධ්‍යාපනය - I

**සැලකිය යුතුයි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. රාජ්‍ය තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමත්, පුරවැසියන් පොදු අරමුණක් කරා මෙහෙයවීමත් කරනු ලබන ආයතනය වන්නේ,
   (1). පොලිසිය යි. (3). ආණ්ඩුව යි.
   (2). කැබිනට් මණ්ඩලය යි. (4). හමුදාව යි.
2. රාජ්‍යයක් තුළ විවිධ සංස්කෘතීන්ට අයත් පිරිස් ජීවත් වුවත් ඔවුන් සියලු දෙනා පොදුවේ හඳුන්වන්නේ,
   (1). ජනවර්ග ලෙස යි. (3). ගෝත්‍රය ලෙස යි.
   (2). ජාතිය ලෙස යි. (4). කුලය ලෙස යි.
3. පුද්ගලයාට තම දේශපාලන, ආර්ථික සහ සමාජයීය අවශ්‍යතා ඉටුකර ගැනීමට සමාජයෙන් ලැබෙන ඉඩකඩ හඳුන්වන්නේ,
   (1). අයිතිවාසිකම් ලෙස ය. (3). සමානාත්මතාවය ලෙස ය.
   (2). නිදහස ලෙස ය. (4). යුතුකම් ලෙස ය.
4. ආර්ථිකයක සම්පත්, මිනිස් වුවමනා ඉටු කර ගත හැකි ආකාරයට වෙනස් කිරීම හඳුන්වන්නේ,
   (1). නිෂ්පාදනය ලෙස ය. (3). පාරිභෝජනය ලෙස ය.
   (2). බෙදා හැරීම ලෙස ය. (4). වෙළඳාම ලෙස ය.
5. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ (UNO) ප්‍රධාන පරිපාලන ආයතනය වන්නේ,
   (1). මහා මණ්ඩලය යි. (3). ආරක්ෂක මණ්ඩලය යි.
   (2). ලේකම් කාර්යාලය යි. (4). ජාත්‍යන්තර අධිකරණය යි.

6. මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු වෙත ලබාදීම හඳුන්වන්නේ,
   (1). බලය පැවරීම ලෙස ය.
   (2). බලය විමධ්‍යගත කිරීම ලෙස ය.
   (3). බලය විතැන් කිරීම ලෙස ය.
   (4). බලය බෙදා හැරීම ලෙස ය.
7. පුද්ගලයින් සදාචාරාත්මක යුතුකම් ඉටු කිරීමේදී විනිශ්චයකරුවා බවට පත්වන්නේ,
   (1). ශ්‍රේෂ්ඨාධිකරණය යි.
   (2). පුද්ගල හෘද සාක්ෂිය යි.
   (3). සමාජ වපසරිය යි.
   (4). සමථ මණ්ඩලය යි.
8. නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව පාරිභෝගික භාණ්ඩ පමණක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1). ආහාර, ඖෂධ, ඇඳුම්
   (2). ඇඳුම්, ඖෂධ, පොහොර
   (3). ආහාර, පොහොර, දැව
   (4). ඇඳුම්, ආහාර, දැව
9. ගැටුමට මුල්වන සමාජ, ආර්ථික, දේශපාලන වාතාවරණය හඳුන්වන්නේ,
   (1). ආකල්ප ලෙස ය.
   (2). සන්දර්භය ලෙස ය.
   (3). චර්යාව ලෙස ය.
   (4). ප්‍රතිරූපය ලෙස ය.
10. පන්ති කාමරය තුළ සිසුන් අතර ඇතිවන ගැටුම්, නිරාකරණය සඳහා යොදාගත හැකි මූලික ක්‍රමය වන්නේ,
   (1). සාකච්ඡා කිරීම ය.
   (2). බේරුම් කිරීම ය.
   (3). සමථකරණය ය.
   (4). විනිසීම ය.
11. ශ්‍රී ලංකා දේශීය නීතිය අනුව සිවිල් නීතිය යටතේ විභාග කළ හැකි වරදක් වන්නේ,
   (1). රාජ්‍ය විරෝධී ක්‍රියා ය.
   (2). විවාහ සම්බන්ධ ගැටලු ය.
   (3). ස්ත්‍රී දූෂණ ය.
   (4). මත්ද්‍රව්‍ය විකිණීම ය.
12. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට මූලික අයිතිවාසිකම් ඇතුළත් වන්නේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?
   (1). 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය
   (2). 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය
   (3). 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය
   (4). 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය
13. රටක සංවර්ධනය මැනීමේ දී යොදා ගන්නා සාම්ප්‍රදායික මිනුම් දණ්ඩක් වන්නේ,
   (1). දුරකථන ඝනත්වය යි.
   (2). මානව පීඩන දර්ශකය යි.
   (3). දළ ජාතික නිෂ්පාදිතය යි.
   (4). හරිත දළ දේශීය නිෂ්පාදිතය යි.
14. බිම්ස්ටෙක් **(BIMST-EC)** සංවිධානයට අයත් **නොවන** රට තෝරන්න.
   (1). ස්විට්සර්ලන්තය
   (2). ඉන්දියාව
   (3). මියන්මාරය
   (4). තායිලන්තය
15. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ සාමකාමී ජන සමාජයක් ගොඩනැගීමට හේතුවන කරුණක් වන්නේ,
   (1). පාලකයා නීතියට ඉහළින් තැබීම ය.
   (2). බහුතර මතයට පමණක් ගරු කිරීම ය.
   (3). සාකච්ඡා මගින් තීරණවලට එළඹීම ය.
   (4). සුළුතරයේ අදහස් නොසලකා හැරීම ය.
16. 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමයේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පාලන කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පළාත් සභාව වෙත සාමූහිකව වගකීමට බැඳී සිටින්නේ,
   (1). ආණ්ඩුකාරවරයා හා මහ ඇමතිවරයා යි.
   (2). මහ ඇමතිවරයා හා අමාත්‍ය මණ්ඩලය යි.
   (3). ආණ්ඩුකාරවරයා හා අමාත්‍ය මණ්ඩලය යි.
   (4). මහ ඇමතිවරයා හා විපක්ෂ නායකවරයා යි.
17. යුක්තිය ඇති කිරීම සම්බන්ධයෙන් වැදගත්වන කරුණ කුමක්ද?
   (1). නඩු විභාගයකින් තොරව වන්දි ගෙවා සාමදාන වීම.
   (2). තමාගේ නිර්දෝෂීභාවය සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම.
   (3). තමාට ඉදිරිපත්ව ඇති චෝදනා මොනවාදැයි දැන ගැනීම.
   (4). නඩු විභාගය සඳහා තමාට පක්ෂපාති නීතිඥයෙකු තෝරා ගැනීම.

PAST PAPERS WIKI

18. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමට පදනම් වූ මූලධර්මයක් වනුයේ,
    (1). කැමති ආගමක් ඇදහීම සහතික කිරීම යි.
    (2). නිදහස් අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම යි.
    (3). ළමයා වෙනස්කොට නොසලකා කටයුතු කිරීම යි.
    (4). පවුලේ සාමාජිකයකු ලෙස හිමිවිය යුතු ස්ථානය සහතික කිරීම යි.
19. ශ්‍රී ලංකාවේ පළාත් පාලනය සම්බන්ධයෙන් දක්වා ඇති නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1). දීර්ඝ ඉතිහාසයක් නොමැති මෑත කාලීනව මතු වූවකි.
    (2). පළමු මහ නගර සභා වූයේ කොළඹ, මහනුවර සහ ගාල්ල ය.
    (3). 1978 ව්‍යවස්ථාවට කරන ලද 14 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පිහිටුවීය.
    (4). ප්‍රාදේශීය පාලනය අඩාළ කරන පාලන ව්‍යුහයකි.
20. සංවර්ධිත රටවල ලක්ෂණයක් වන්නේ,
    (1). තාක්ෂණික දැනුම අඩු මට්ටමක පැවතීම ය.
    (2). ළදරු මරණ අනුපාතිකය අඩුවීම ය.
    (3). අවාසිදායක වෙළඳ ශේෂයක් පැවතීම ය.
    (4). විරැකියාව වැඩි අගයක් ගැනීම ය.
21. ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික අර්බුදයට සහනයක් ලෙස ආධාර සපයන එක්සත් ජාතීන්ට අනුබද්ධිත ආයතනය කුමක්ද?
    (1). එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)
    (2). එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)
    (3). ලෝක බැංකුව (IBRD)
    (4). අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF)
22. සංවර්ධනය වන රටවල ගැටලු විසඳීම සඳහා ගත හැකි හොඳම විසඳුම වන්නේ,
    (1). ඒකාකාරී වෙළෙඳපොළ සොයා යාම.
    (2). ආනයන භාණ්ඩ බහුලව භාවිතා කිරීම.
    (3). විකල්ප බලශක්ති හඳුන්වා දීම සහ භාවිතය.
    (4). දේශීය ආයෝජන වෙනුවට විදේශ ආයෝජන දිරිගැන්වීම.
23. රටක සාමකාමී දේශපාලන වාතාවරණයක් ගොඩනැගීමටත්, වංචා දූෂණ ආදියෙන් තොර සාමකාමී සමාජයක් ගොඩනැගීමටත් හේතුවන වැදගත්ම කරුණ කුමක්ද?
    (1). බුද්ධිමත් හා දේශපාලන අවබෝධයෙන් යුතු ජනතාවක් සිටීම.
    (2). නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම.
    (3). නීතියේ ආධිපත්‍යය හා අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීම.
    (4). නිදහස් හා අපක්ෂපාතී ජනමාධ්‍යයක් පැවතීම.
24. සමාජය තුළ යහපාලන ගුණාංග වර්ධනය කිරීමේදී ආර්ථික ක්ෂේත්‍රයේ දියුණුවට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,
    (1). අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීම.
    (2). ස්වාධීන තීරණ ගැනීමට බාධා නොකිරීම.
    (3). කැමති ප්‍රදේශයක පදිංචි වීමට අවස්ථාව ලබාදීම.
    (4). ආදායම් බෙදීයාමේ විෂමතා අවම කිරීමට පියවර ගැනීම.
25. රාජ්‍ය අභ්‍යන්තරයේ පුළුල් මට්ටමින් පවතින ජන වර්ග, ආගම් හා වෘත්තීය සමිති අතර ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,
    (1). සූක්ෂ්ම ගැටුම්
    (2). සාර්ව ගැටුම්
    (3). සාධනීය ගැටුම්
    (4). නිශේධනීය ගැටුම්
26. අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීමෙන්,
    (1). රට තුළ සිදුවන අපරාධ හා දූෂණ වර්ධනය වේ.
    (2). නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට පැමිණේ.
    (3). යුක්තිය ඉටුකර ගැනීමට අනියම් ක්‍රම භාවිතා කෙරේ.
    (4). අධිකරණ පද්ධතිය පිළිබඳ විශ්වාසය වර්ධනය වේ.

27. සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය අයත් වන්නේ,
(1). ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්වලට ය.
(2). සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම්වලට ය.
(3). ආර්ථික හා සමාජ අයිතිවාසිකම්වලට ය.
(4). සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලට ය.

28. තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පුරවැසියෙකු ලෙස කළ යුතු වැදගත්ම දේ වන්නේ,
(1). පාරසරික නීති හා ප්‍රමිතීන් සැකසීම ය.
(2). පරිසර සංරක්ෂණ වැඩසටහන් සැලසුම් කිරීම ය.
(3). අධි පරිභෝජන සීමා පැනවීම හා දැනුවත් කිරීම ය.
(4). පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා භාවිත කිරීම ය.

29. ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් අත්වන වාසියක් වන්නේ,
(1). සංවර්ධන කටයුතු සඳහා සහයෝගය ලැබීම යි.
(2). මිතුරු හෝ සතුරු වශයෙන් එක් පක්ෂයක් ගැනීමට හැකිවීම යි.
(3). රටේ වටිනා සම්පත් හා දේපළ ආරක්ෂා වීම යි.
(4). බලගතු රාජ්‍යයක් ලෙස ඉදිරියට පැමිණීමට හැකිවීම යි.

30. සන්ධීය ආණ්ඩු ක්‍රමයක යහපත් ලක්‍ෂණයක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1). ඉක්මනින් හා පහසුවෙන් තීරණ ගත හැකි වීම.
(2). පාලනයේදී සාමකාමී තත්ත්වයක් ඇතිවීම.
(3). භූමි ප්‍රමාණයෙන් විශාල රාජ්‍ය සඳහා වඩාත් යෝග්‍ය වීම.
(4). පරිපාලන ක්‍රමය හා අධිකරණ ක්‍රමය පොදු එකක් වීම.

31. මිශ්‍ර ආර්ථික ක්‍රමයක දැකිය හැකි ලක්‍ෂණයක් වන්නේ,
(1). මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් විසින් ආර්ථිකය මෙහෙයවීම යි.
(2). ලාභය අරමුණු කරගෙන නිෂ්පාදන සිදු කිරීම යි.
(3). දේපළ අයිතිය රාජ්‍ය අංශය සතුවීම යි.
(4). සුභසාධනය ලබාදීමට රාජ්‍ය මැදිහත්වීම යි.

32. අයිතිවාසිකම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1). විවිධ අරගල හා සටන් මඟින් දිනාගත් බව පිළිගනී.
(2). ජාතිය, ජනවර්ගය, ආගම, භාෂාව අනුව හිමිකම් තිබීම විශේෂත්වයකි.
(3). සෑම මානව හිමිකමක්ම මූලික අයිතිවාසිකමක් ලෙස සැලකේ.
(4). සමාජය ක්‍රමයෙන් දියුණු වීමත් සමඟ අවධානය අඩු විය.

33. සාර්ක් සංවිධානය පිහිටුවීමේ අරමුණක් සහිත පිළිතුර තෝරන්න.
(1). අභ්‍යන්තර දේශපාලන ගැටුමකදී එකිනෙකාට උදව් උපකාර කිරීම.
(2). කලාපීය ජනතාවගේ සුබ සාධනය හා ජීවන තත්ත්වය වැඩි කිරීම.
(3). යුදමය සංවිධානයක් ලෙස කලාපයේ ආරක්ෂාව තහවුරු කිරීම.
(4). රාජ්‍ය නායකයන් අතර සුහද හමු පැවැත්වීම.

34. ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය හඳුන්වන නම වන්නේ,
(1). පාර්ලිමේන්තුව ලෙස ය.
(2). සන්ධීය මහා මණ්ඩලය ලෙස ය.
(3). කොංග්‍රස් මණ්ඩලය ලෙස ය.
(4). සන්ධීය සභාව ලෙස ය.

35. රටක ආර්ථික සංවර්ධනය මන්දගාමී වීමටත්, සමාජ සාධාරණත්වය බිඳවැටීමටත් බලපාන හේතුවක් වන්නේ,
(1). රාජ්‍ය පාලනයේ කාර්යක්ෂමතාවය ඉහළ යාම.
(2). රාජ්‍ය සේවය නිර් - දේශපාලනීකරණය වීම.
(3). අල්ලස සහ දූෂණය ඉහළ යාම.
(4). රාජ්‍ය පාලකයින් වගකීමෙන් කටයුතු කිරීම.

Past Papers Wiki

36. ගෝලීයකරණය ශ්‍රී ලංකාවට සිදුකරන සෘණාත්මක බලපෑමක් වන්නේ,
   (1). විදේශ ණය ලබා ගැනීමේදී කොන්දේසිවලට යටත් වීමට සිදුවීම යි.
   (2). අකාර්යක්ෂම කර්මාන්ත වෙළඳපොළෙන් ඉවත් වීම යි.
   (3). දේශීය නිෂ්පාදන සාධක සඳහා වැඩි ඉල්ලුමක් ඇතිවීම යි.
   (4). ආර්ථික විවිධාංගීකරණයක් සිදුවීම යි.

37. 1978 ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකයේ (පාර්ලිමේන්තුවේ) බලතල හා කාර්යයන් ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

   A. නීති සම්පාදනය කිරීම
   B. දෝෂාභියෝග ඉදිරිපත් කිරීම
   C. නීති විවරණය කිරීම
   D. නියෝග හා ආඥා පැනවීම
   E. ප්‍රශ්න ඇසීම

   (1). A, B හා E (2). B, C හා E (3). A, C හා E (4). B, D හා C

38. පහත සඳහන් ප්‍රකාශ හා සම්බන්ධ ආයතනය කුමක් ද?
   - සුළු වැරදි, පවුල් ආරවුල්, ප්‍රාථමික මට්ටමින් විසඳිය හැකිය.
   - අධිකරණ අමාත්‍යාංශය මගින් නීත්‍යානුකූල ආයතනයක් ලෙස ස්ථාපිත කර තිබීම
   - ඕනෑම පුරවැසියෙකු වෙත පහසුවෙන් අවශ්‍යතා ඉටුකර ගත හැකි වීම

   (1). ශ්‍රේෂ්ඨාධිකරණය (2). දිසා අධිකරණය (3). මහාධිකරණය (4). සමථ මණ්ඩලය

39. පහත සඳහන් "අ" තීරුවෙන් ලංකාවේ පැවති ආණ්ඩුක්‍රම හා "ආ" තීරුවෙන් එම ආණ්ඩුක්‍රමයන් මගින් හඳුන්වා දුන් ව්‍යවස්ථාදායක සභාවන් හැඳින්වූ ආකාර දැක්වේ. ඒ අනුව "අ" තීරුව හා "ආ" තීරුව සමඟ ගැළපූ විට නිවැරදි පිළිතුරු කාණ්ඩය කුමක්ද ?

| "අ" | "ආ" |
|---|---|
| 1. 1910 මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | A. රාජ්‍ය මන්ත්‍රණ සභාව |
| 2. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | B. ජාතික රාජ්‍ය සභාව |
| 3. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | C. ව්‍යවස්ථාදායක සභාව |
| 4. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය | D. පාර්ලිමේන්තුව |

   (1). BCDA (2). BDAC (3). CADB (4). CABD

40. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න
   A - සංවර්ධිත රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ඉහළ සාක්ෂරතා මට්ටමක් පවතී
   B - සංවර්ධන අභියෝගයන්ට මුහුණ දීමට ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තය දියුණු කරමින් සිටී

   එම ප්‍රකාශ අතුරින්,

   (1). A ප්‍රකාශය මගින් B ප්‍රකාශය පැහැදිලි කරයි.
   (2). A ප්‍රකාශය සත්‍ය වන අතර B ප්‍රකාශය අසත්‍ය වේ.
   (3). A ප්‍රකාශය අසත්‍ය වන අතර B ප්‍රකාශය සත්‍ය වේ.
   (4). A හා B යන ප්‍රකාශ දෙකම සත්‍ය වේ.

**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

| 62 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව - 2026

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

## පුරවැසි අධ්‍යාපනය II

- ❖ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ
- ❖ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. (i). නූතන ජාතික රාජ්‍ය බිහිවීම සඳහා අවශ්‍ය පසුබිම සැපයූ දේශපාලන චින්තකයින් **දෙදෙනකු** නම් කරන්න.
   (ii). පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක විධායකය කොටස් **දෙකකි**. නම් කරන්න.
   (iii). 1957 දී ලංකාවේ බලය බෙදා හැරීම සඳහා ගිවිසුමක් ඇති කරගත් දේශපාලන නායකයින් **දෙදෙනා** නම් කරන්න.
   (iv). උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම **(NAFTA)** සඳහා සම්බන්ධ රටවල් **දෙකක්** ලියන්න.
   (v). නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** ලියන්න.
   (vi). 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ව්‍යවස්ථාදායක සභාවට සමාජිකයන් පත් වූ ප්‍රධාන ආකාර **දෙක** හා එහි සංයුතිය ලියන්න.
   (vii). කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා ශ්‍රී ලංකාව සම්මත කර ක්‍රියාත්මක කරන පනත් **දෙකක්** ලියන්න
   (viii). සම්පත්වල ඵලදායිතාව හා කාර්යක්ෂමතාව සඳහා යොදාගන්නා **3R** ක්‍රමවේදයේ අවස්ථා **දෙකක්** දක්වන්න.
   (ix). එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවල් අතුරින් **දෙකක්** ලියන්න.
   (x). ශ්‍රී ලංකාවේ උතුරු දුම්රිය මාර්ගය හා දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදි කිරීමට ආධාර ලබාදුන් රටවල් **දෙක** පිළිවෙලින් නම් කරන්න. **(ලකුණු 02×10 = 20 යි)**

2. රාජ්‍යයක පුරවැසියන්ට ඍජුවම පාලන කටයුතු සඳහා සහභාගී වීමට ඇති අවස්ථාව සීමිත වීම නිසා නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් සාර්ථක පාලන ක්‍රමයක් බවට වර්තමානයේ පත් වී ඇත.
   (i). ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කරන ආයතනය හා මැතිවරණය පැවැත්වීමේ බලය සහිත ආයතනය පිළිවෙලින් නම් කරන්න. **(ලකුණු 02 යි)**
   (ii). ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. **(ලකුණු 03 යි)**
   (iii). (a). ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මඟින් ඉටු කළ යුතු කාර්යයන් **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02 යි)**
   (b). ඉහත **(a)**හි සඳහන් එක් කාර්යයක් සමාජයක යහපැවැත්ම සඳහා ඉවහල් වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

3.වර්තමාන සමාජයන් සංස්කෘතික බහුවිධතාවයකින් යුක්ත සංකීර්ණ එකක් වුවත්, බොහෝ රාජ්‍යයන් දියුණු තත්ත්වයට පැමිණ ඇත්තේ විවිධත්වය තුළ එක්සත්කම ගොඩනගාගෙන ඇති බැවිනි.

(i). ශ්‍රී ලංකාවේ සිංහල ජනතාව අදහන ආගම් **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02 යි)**

(ii). බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියෙකු ලෙස ප්‍රගුණ කළ යුතු ගුණාංග **තුනක්** ලියන්න. **(ලකුණු 03 යි)**

(iii). (a). බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** ලියන්න. **(ලකුණු 02 යි)**

(b). ශ්‍රී ලංකාව තුළ ජනවර්ග අතර එක්සත් බවක් ඇති කිරීමට පාසල් සිසුවෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

4. සමාජ සංවර්ධන ක්‍රියාවලිය තුළ සාධනීය හා නිර්මාණාත්මක වැඩ කොටසක් ඉටුකරන බලවේගයක් ලෙස ගැටුම හඳුනාගත හැකිය.

(i). අන්තර්ජාතික ගැටුම් ප්‍රධාන කොටස් **දෙකක්** යටතේ හඳුනාගත හැකිය. ඒ මොනවාද? **(ලකුණු 02 යි)**

(ii). ගැටුම් නිරාකරණයට මැදිහත්කරුවකු තෝරාගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු **තුනක්** ලියන්න. **(ලකුණු 03 යි)**

(iii). (a). ගැටුම් නිරාකරණය සඳහා එකඟත්වයක් ගොඩනැගීම යොදාගත හැකි අවස්ථා **දෙකක්** ලියන්න. **(ලකුණු 02 යි)**

(b). පාසල් සිසුන් අතර ඇතිවන ගැටුම් නිරාකරණයට උපදේශනයෙන් ලබාදිය හැකි විසඳුම් කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

5. නීතියට ගරු කිරීම හා අවනත වීම පුරවැසියන්ගේ ප්‍රධාන වගකීමක් වන අතර, එය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ.

(i). බේරුම්කරණය සිදුවන ආකාරය අනුව වර්ග කළ හැකි කොටස් **දෙක** ලියන්න. **(ලකුණු 02 යි)**

(ii). ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානීන් **තිදෙනෙකු** නම් කරන්න. **(ලකුණු 03 යි)**

(iii). (a). අධිකරණයේ ස්වාධීනත්වය පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති ප්‍රතිපාදන **දෙකක්** දක්වන්න. **(ලකුණු 02 යි)**

(b).පාසල් ශිෂ්‍යයෙකු ලෙස පාසලේ නීති රීති ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි කාර්යභාරය විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

6. සමාජයේ යහපත් පුරවැසියකු ලෙස ජීවත්වීම සඳහා මානව හිමිකම් හා යුතුකම් පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වේ.

(i). කාන්තාවන් සම්බන්ධයෙන් ලිච්ඡවි රජදරුවන් අනුගමනය කළ චාරිත්‍ර ධර්ම **දෙක** ලියන්න. **(ලකුණු 02 යි)**

(ii). පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආයතන **තුනක්** ලියන්න. **(ලකුණු 03 යි)**

(iii). (a). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග උදෙසා පැමිණිලි කළ හැකි ආයතන **දෙකක්** ලියන්න. **(ලකුණු 02 යි)**

(b). මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමා පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. **(ලකුණු 03 යි)**

7. වර්තමානයේ දී පරිසරය පිළිබඳව දැඩි අවධානයට ලක්ව ඇත්තේ මානව බලපෑම් මගින් පාරිසරික සමතුලිතතාවය බිඳවැටීමයි.

(i). පරිසර පද්ධතිය සකස් වී ඇති ප්‍රධාන සංරචක **දෙකක්** දක්වන්න. **(ලකුණු 02 යි)**

(ii). භෞතික පරිසරයේ සිදුවන ස්වාභාවික සංසිද්ධි **තුනක්** ලියන්න. **(ලකුණු 03 යි)**

(iii). (a). සමාජ පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල **දෙකක්** ලියන්න. **(ලකුණු 02 යි)**

(b). ඉන් එක් අහිතකර ප්‍රතිඵලයක් වළක්වා ගැනීමට ඔබට කළ හැකි දැ කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

***

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Minister of Education, Higher Education and Vocational Education
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர) உதவி மதிப்பீடு - 2026**
General Certificate of Education (Ordinary Level) Examination - 2026

උපකාරක තක්සේරුව - පිළිතුරු පත්‍රය
**உதவி மதிப்பீடு** - விடைப்பத்திரம
**Supportive Assessment** - Answer Sheet

සිංහල මාධ්‍යය
தமிழ் மொழி மூலம்
Sinhala Medium

# පුරවැසි අධ්‍යාපනය

## CIVIC EDUCATION - குடியியற் கல்வி




**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
**கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**
தேசிய மொழிகள் மற்றும் சமூக விஞ்ஞான கிளை
**Ministry of Education, Higher Education and Vocational Education**
National Languages and Humanities Branch

## පුරවැසි අධ්‍යාපනය I - පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 4 | 31. | 4 |
| 02. | 2 | 12. | 3 | 22. | 3 | 32. | 1 |
| 03. | 1 | 13. | 3 | 23. | 1 | 33. | 2 |
| 04. | 1 | 14. | 1 | 24. | 4 | 34. | 3 |
| 05. | 2 | 15. | 3 | 25. | 2 | 35. | 3 |
| 06. | 4 | 16. | 2 | 26. | 4 | 36. | 1 |
| 07. | 2 | 17. | 3 | 27. | 1 | 37. | 1 |
| 08. | 1 | 18. | 3 | 28. | 4 | 38. | 4 |
| 09. | 2 | 19. | 2 | 29. | 1 | 39. | 3 |
| 10. | 1 | 20. | 2 | 30. | 3 | 40. | 4 |

**(මුළු ලකුණු 1×40 = 40)**

## පුරවැසි අධ්‍යාපනය II - පිළිතුරු පත්‍රය

1.

I.

- නිකොලායි මැකියාවෙලි
- ජීන් බොඩෑන්
- තෝමස් හොබ්ස් **(මින් ඕනෑම නම් දෙකක්)**

II.

- නාමික විධායකය
- සත්‍ය විධායකය

III.

- SWRD බණ්ඩාරායක
- SJV චෙල්වනායගම් **(මුලකුරු නොමැති වුව ද ලකුණු ලබා දෙන්න)**

IV

- ඇමරිකා එක්සත් ජනපදය
- කැනඩාව
- මෙක්සිකෝව **(මින් ඕනෑම රටවල් දෙකක්)**

V.

- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම,
- නීතිය පිළිබඳ ව සෑම පුරවැසියෙකුට ම අවබෝධයක් තිබීම
- නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් ලෙස නොසැලකීම
- සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම
- පුද්ගලයන්ගේ තරාතිරම රැකියාව, ධනය හෝ වෙනත් කරුණු පදනම් කරගෙන නීතිය ක්‍රියාත්මක නොවීම
- නීතිය ඉදිරියේ සෑම දෙනා ම සමාන පුද්ගලයන් සේ සැලකීම
- විනිශ්චයකාරවරුන්ට තම තීන්දු ගැනීමේ දී බලපෑම් සිදු නොවීම

**(මින් ඕනෑම කරුණු දෙකක්)**

VI.

- නිලලත් - 9
- නිලනොලත් 6

VII

- සාප්පු හා කාර්යාල සේවක පනත
- ප්‍රසූති ආධාර ආඥා පනත
- කාර්මික ආරවුල් පනත
- පඩි පාලක සභා ආඥා පනත
- සේවක අර්ථසාධක අරමුදල් පනත **(මින් ඕනෑම පනත් දෙකක්)**

VIII.

- අවම කිරීම
- නැවත භාවිතය
- ප්‍රතිචක්‍රීකරණය **(මින් ඕනෑම කරුණු දෙකක්)**

IX.

- ඇමරිකා එක්සත් ජනපදය
- බ්‍රිතාන්‍ය
- ප්‍රංශය
- රුසියාව
- චීනය **(මින් ඕනෑම රටවල් දෙකක්)**

X.

- ඉන්දියාව
- චීනය

**(ලකුණු 2×10 = 20)**

2.

I.

- මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාව
- මැතිවරණ කොමිෂන් සභාව **(ලකුණු 02)**

II.

- පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම
- පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ පාලක හා පාලිත දෙපක්ෂය ම දැනුවත් වීම
- පාලකයන් අත්තනෝමතික ලෙස ක්‍රියා කළහොත් එය වළක්වා ගත හැකි වීම
- අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම
- මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම
- ආණ්ඩුක්‍රමයට සම්බන්ධ ආයතනවලින් රටවැසියන්ට සිය අවශ්‍යතා, සිතුම්පැතුම් ඉටු කර ගත හැකි වීම.
- නීතියේ රැකවරණය සැමට සමාන ව ලැබීම **(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාව වෙත සැපයීම
- අපක්ෂපාතීව සහ සමාජයේ යහපැවැත්මට හිතකර අන්දමින් තොරතුරු සැපයීම
- ජනතාවගේ දුක් ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමු කිරීම
- පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතට යොමු කිරීම
- ජනතාවගේ දැනුම වර්ධනය කිරීම
- කාලීන තොරතුරු නිසි වේලාවට ජනතාවට ලබා දීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b) **(නිදහස් මාධ්‍යයකින් සමාජ යහපැවැත්ම ආරක්ෂාවන ආකාරය සිසුවා විසින් කෙටියෙන් විස්තර කර තිබිය යුතුයි. - ලකුණු 03)**

3.

I.

- බෞද්ධ
- හින්දු
- ක්‍රිස්තියානි / කතෝලික **(මින් ඕනෑම ආගම් දෙකක් සඳහා ලකුණු 02)**

II.

- එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනා ගැනීම හා අවබෝධයෙන් යුතු ව කටයුතු කිරීම,
- එකිනෙකාට ගරු කිරීම
- අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
- ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම
- සාමූහිකත්වය වර්ධනය කිරීම
- එක්සත්ව කටයුතු කිරීමෙන් ජයග්‍රහණ ලබා ගැනීම පහසු බව අවබෝධ කර ගැනීම
- අනෙකුත් ජනවර්ගවල භාෂාවන් ඉගෙනීම හා භාවිතය
- සර්ව ආගමික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම **(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.
- ගැටුම් අවම වේ.
- අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වේ.
- එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය වේ.
- මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ.
- රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම පුරවැසියකුම නොපිරිහෙලා කටයුතු කිරීම හා එය ජාතික යුතුකමක් සේ සලකා කටයුතු කිරීමට පෙළඹේ.
- අන්‍ය ආගම් හෝ සංස්කෘතීන්ට අගරු නොවන ආකාරයට හැසිරීමට හුරු වේ

**(මින් ඕනෑම ආගම් දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- සහජීවනය පවත්වා ගැනීම
- එකිනෙකාගේ සාංස්කෘතික උත්සවවලට සහභාගී වීම.......... යනාදී වශයෙන්

**(සිසුවා විසින් පාසල් ශිෂ්‍යයෙකු ලෙස ගත හැකි ඕනෑම ක්‍රියාමාර්ගයක් විස්තර කර තිබේ නම් නියමිත ලකුණු ප්‍රදානය කරන්න) (ලකුණු 03)**



Past Papers Wiki
PAST PAPERS WIKI

4.

I.

- මතවාදී ගැටුම්
- යුදමය ගැටුම් **(ලකුණු 02)**

II.

- දෙපාර්ශ්වය ම පිළිගන්නා අපක්ෂපාතී පුද්ගලයකු වීම
- ගැටුම පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති අයෙකු වීම
- තමාගේ විසඳුම්, තීන්දු ඔවුන් මත පටවන්නකු නොවීම
- දෙපාර්ශ්වයට ම බලපෑම් එල්ල නොකිරීම
- දෙපාර්ශ්වයේ ම එකඟතාව මත විසඳුම් කරා යොමු කරවීම
- ඍජු ව මුණ ගැසීමට නොහැකි අවස්ථාවල වෙන වෙන ම හමු වී අදහස් ලබාගෙන දෙපාර්ශ්වයට ම සන්නිවේදනය කිරීම
- නම්‍යශීලී විසඳුම් කරා යොමු කර "ජය - ජය" විසඳුම් ලබා දීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 03)**

III. (a)

- පවුල් ආරවුල්
- සේව්‍ය - සේවක ආරවුල්
- අසල්වාසීන් සමඟ ඇති ආරවුල්
- ආයතන - ආයතන අතර ඇතිවන ආරවුල්
- සමවිය කණ්ඩායම් අතර ඇති ආරවුල්

**(මින් ඕනෑම ගැටුම් දෙකක් සඳහා ලකුණු 02 )**

(b)

- විකල්ප විසඳුම් කරා පාර්ශ්වකරුවන් යොමු කිරීම,
- ගැටුමින් ඇතිවන ප්‍රතිඵල හා පීඩාකාරී ස්වභාවයන් පිළිබඳ ව දෙපාර්ශ්වය ම දැනුවත් කිරීම,
- ගැටුම් ලිහිල් කිරීම සඳහා පාර්ශ්වකරුවන් යොමු කරවීම

**(මෙයින් එකක් සිසුවා විසින් විස්තර කර තිබීම ප්‍රමාණවත්ය. - ලකුණු 03)**

5.

I.

- අනිවාර්ය බේරුම්කරණය
- ස්වේච්ඡා බේරුම්කරණය **(ලකුණු 02)**

II.

- අගවිනිසුරුවරයා
- අධිකරණ ඇමති
- නීතිපති

**(ලකුණු 03)**

III. (a)

- ස්වාධීනව විනිශ්වයකාරවරුන් පත් කිරීම
- විනිසුරුවරුන් පත් කරන්නා සේ ඉවත් කළ නොහැකි වීම
- විනිසුරුවරුන්ගේ වැටුප් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම
- විනිසුරුවරුන් වෙනත් තනතුරු පිළිගනු ලබන්නේ නම් ඒ සඳහා විශේෂ අවසරයක් ලබා ගැනීම

- අනවශ්‍ය මැදිහත්වීම් හා පාලනය කිරීම් සීමා කිරීම
- අධිකරණ සේවා කොමිසම ඇති කිරීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- නියමිත වේලාවට පාසල් පැමිණීම.
- නියමිත පරිදි නිල ඇඳුම ඇඳීම
- සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම
  **(යනාදී වශයෙන් නීතිගරුක ශිෂ්‍යයෙකු ලෙස කටයුතු කරන ආකාරය පිළිබඳව සිසුවා අපේක්ෂා කරන පිළිතුරු පිළිබඳ සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න.)** **(ලකුණු 03)**

6.

I.

- අවිවාහක කුල කුමරියන් ආරක්ෂා කිරීම
- විවාහක කුල කාන්තාවන් ආරක්ෂා කිරීම **(ලකුණු 02 )**

II.

- පරිසර අමාත්‍යාංශය
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- භූ විද්‍යා හා පතල් කැනීමේ කාර්යාංශය
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව **(මින් ඕනෑම ආයතන තුනක් සඳහා ලකුණු 03 )**

III. (a)

- ශ්‍රේෂ්ඨාධිකරණය
- මානව හිමිකම් කොමිසම
- ඔම්බුඩ්ස්මන්වරයා **(ලකුණු 03)**

(b)

- ජාතික ආරක්ෂාව,
- වාර්ගික හා ආගමික සහයෝගිතාව වර්ධනය කිරීම,
- ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම,
- මහජන සෞඛ්‍ය,
- සදාචාරය,
- අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ගරු කිරීම,........ **(ආදී වශයෙන් මූලික අයිතීන් සීමාවන ආකාරය පිළිබඳ සිසුන් යෝජනා කරන පිළිතුරු පිළිබඳ සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න)**

**(ලකුණු 03)**

7.

I.

- අජෛව සංරචක
- ජෛව සංරචක
- සමාජ පරිසරය
- ස්වාභාවික පරිසරය **(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**


අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
Past Papers Wiki

II.

- කාබන් චක්‍රය
- ජල චක්‍රය
- ඛනිජ චක්‍රය
- ආහාර දාමය

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03 )**

III. (a)

- සමාජ සබඳතා බිඳ වැටීම
- ආගමික හා වාර්ගික ගැටුම් ඇති වීම
- සමාජ අසාධාරණකම් සිදු වීම
- පවුල් සංස්ථා බිඳ වැටීම
- දෙමාපිය දූ දරු සබඳතා බිඳ වැටීම
- සමාජ දුරාචාර වැඩි වීම
- සමාජ විරෝධී ක්‍රියා වැඩි වීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)

**(ඉහත දක්වා ඇති අහිතකර ප්‍රතිඵල මගහරවා ගැනීමට සිසුන් යෝජනා කරන පිළිතුරු පිළිබඳ සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න)** **(ලකුණු 03)**

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library